# මිනිසා මිනිසෙකු ලෙස දැක් වූ

සත්‍යවාදය නම් වූ

# රෝම මූර්ති කලාව

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
චන්දන රෝහන විතානාච්චි
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
බාහිර කථිකාචාර්ය භික්ෂු සරසවිය.





"රෝම මූර්ති කලාව" වශයෙන් හඳුන්වනු ලබන්නේ ග්‍රීක ප්‍රතිමා කලාවේ ආභාෂය ගෙන රෝම කලාකරුවන් විසින් නිර්මාණය කරන ලද මූර්තීන් වේ. ක්‍රිස්තු පූර්ව අවසානයේ දී පමණ ක්‍රමයෙන් ග්‍රීසියේ කලාත්මක ලක්ෂණ රෝමවරුන් විසින් ග්‍රහණය කර ගන්නා ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගල රූප නෙලීමේ කලාව වඩා පුළුල් ලෙස මධ්‍යධරණී ප්‍රදේශයේ ව්‍යාප්ත විය. මේ වර්ධනය සඳහා රෝමයේ රදලවරු විශාල වශයෙන් අනුග්‍රහ දක්වනු ලැබූ අතර ඔවුන්ගේ මාළිගා හා මන්දිර ග්‍රීක උන්නත කැටයම් ඌර්දව කායික (උඩුකය) පුද්ගල රූප හා දේව ප්‍රතිමා ආදියෙන් අලංකාරව පැවති බවට මූලාශ්‍රවලින් පැහැදිලි වේ.

ක්‍රිස්තු පූර්ව පළමු වන සියවස වන විට රෝම අධිපතීන්ට හා රදලයින්ට මූර්ති කලාව පිළිබඳ පැහැදිලි ලෙස වටහා ගැනීමෙ හැකියාවක් නොතිබුණ බැවින් ඔවුන් සතුටු වන පරිදි කටයුතු කිරීමට රෝම මූර්ති ශිල්පීන්ට සිදු විය. ඔවුන් සෑම විට ම අපේක්ෂා කළේ තමා ප්‍රිය කරන අධිපතියෙකුගේ හෝ පුද්ගලයෙකුගේ ප්‍රතිමාවන් ය. නමුත් පසුකලකදී ඉතිහාසය හා යථාර්ථය යනු කුමක් ද යන්න අවබෝධ කර ගැනීම නිසා ක්‍රමයෙන් රදළයින් තුළ කලා රුචිකත්වය වර්ධනය විය. මේ නිසා සමාජ හා ඓතිහාසික පරිසරයට ගැලපෙන ආකාරයෙන් මුහුණේ ලක්ෂණ විග්‍රහත්මක ව පිළිඹිබු කරන ලද පුද්ගල රූප අගය කිරීමට පුරුදු විය. රෝම මූර්ති ශිල්පියා තමාට ආවේනික වූ මගක ගමන් කිරීම ඇරඹීමට මෙම සංකල්පනාත්මක වෙනස් වීම හේතු විය. මේ නිසා ශිල්පීන්ගේ ශිල්ප ඥාණය දියුණු වූ අතර ඔවුන් තමන්ගේ නිර්මාණ වඩාත් කලාත්මක ලෙස රෝම සම්ප්‍රදාය බිහිකරමින් කරන ලදී.

රෝමවරු පුද්ගල රූප කෙරෙහි විශේෂ ලැදියාවක් දක්වන පුද්ගල කොට්ඨාශයක් විය. ඒ සඳහා ඔවුන්ට බලපෑ එක් ප්‍රධාන කරුණකි. මේ සම්බන්ධයෙන් 'ප්ලීනි' කරන විස්තරය වැදගත් වේ. අතීතයේ දී තම මුතුන්මිත්තන්ගේ මරණ වෙස් මුහුණ කුලීන රෝමවරු විසින් තබා ගනු ලැබී ය. ඒවා තම ඥාතීන්ගේ අවමංගල්‍ය කටයුතුවලදී ප්‍රචාරය කර හරින ලදී. මෙම මරණ වෙස් මුහුණු මුලදී බොහෝ විට චිත්‍රයෙන් නිරූපණය කරන ලද අතර පසු කාලීන ව ඌර්ධවකායික පුද්ගල රූප වලින් නිර්මාණය කරන ලදී.

රෝම මූර්ති ශිල්පීන් අතර රෝමවරු සිටියේ ස්වල්ප දෙනෙකි. වඩාත් සිටියේ ග්‍රීක්වරු හෝ එම සංස්කෘතික රටාව තුළ හැඩ ගැසුණු පෙරදිග වැසියෝ ය. විදේශ මූර්ති ශිල්පීන් විශාල පිරිසකට රෝමයේ රැකියාව ලැබුණ අතර ග්‍රීක හා මැසිඩෝනියානු කලා සම්ප්‍රදායන්ගේ සම්මිශ්‍රණය තුළින්, ස්වාධීන රෝම මූර්ති කලාවක් ඇති කිරීමට ක්‍රිස්තු පූර්ව අවසාන භාගය වන විට ඔවුන්ට හැකි විය.







ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසේ දී රෝමයේ බිහි වූ මූර්ති කලාව හඳුන්වනු ලැබුයේ "සත්‍යවාදය" යනුවෙනි. මෙය ග්‍රීක මතවාදයට වඩා සංකීර්ණ වූ අතර, සත්‍යවාදය තුළින් නිරූපණය කිරීමට උත්සාහ ගනු ලැබුයේ 'යථාර්තවාදයයි.' මෙම ක්‍රමය අනුව නිරූපිත පුද්ගලයා ඔහුගේ නියම ස්වභාවයෙන් ම දක්වන ලදී. නිරූපිත පුද්ගලයා තුළින් ඉදිරිපත් කිරීමට උත්සාහ ගනු ලැබුයේ දාර්ශණිකයෙකු, කවියෙකු, චින්තකයෙකු නොව සාමාන්‍ය දෛනික කටයුතුවල යෙදෙන පුද්ගලයෙකු ය. පුද්ගලයා කවරෙකු වුවත් ඔහුගේ මුහුණේ ලක්ෂණ ඇති හැටියෙන් දක්වනු ලැබූ අතර අදාල නොවූ ගුණාංග ඇතුල් නොකිරීම මෙහි ඇති විශේෂත්වයයි. මේ නිසා රෝම මූර්ති කලාව තුළින් කලා රසවින්දනය පිළිබඳ ව කරුණු දැන ගැනීමට හා ප්‍රබෝධයක් ලැබීමට අවස්ථාව රෝමවරුන්ට උදා විය.

මෙම සම්ප්‍රදායේ වර්ධනය පිළිබඳ මූලික සාධක නානක (කාසි) මූලාශ්‍ර වලින් පැහැදිලි වේ. එම පාලකයින්ගේ පාලන කාලය තුළ නිකුත් කරන ලද කාසිවල තමාගේ 'ඌර්ධවකායික හෝ සම්පූර්ණ රූපය අර්ධ උන්නතව දැක්වීම රෝමයේ සම්ප්‍රදායක් බවට පත්ව තිබුණි. රෝම ජාතික පාලකයෙකු වූ ෆැලැමිනියස් ගේ පිළිරුවක් එක් කාසියක දක්නට ලැබේ. එසේම තවත් කාසි කීපයක 'ජූලියස් සීසර්' හා ඔහුට මරු කැඳ වූ 'බ්රූටස්' ගේ රූප ද නිර්මාණය කර තිබේ. මෙකල රෝමවරුන්ගේ මුදුවල ද අර්ධ උන්නත පුද්ගල රූප දක්නට ලැබේ. මෙවැනි රූප තෙලීමේ දක්ෂ ශිල්පියෙකු ලෙස රෝමයේ 'ඩියොස්කුරියඩිස්' දැක්වීමට පුළුවන.

ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසේ මැද භාගය වනවිට විශිෂ්ට උර්ධවකායික මූර්ති රාශියක් රෝමයේ නිර්මාණය වී ඇත. ඒ අතර

'පෙයිඩෝනියස් හා සිසර්' ගේ ඌර්ධවකායික මූර්ති ඉතා වැදගත් වේ. සීසර්ගේ ප්‍රතිමාව තුළින් වික්‍රමාන්විතභාවය පිළිබිඹු කරන අතර ම සත්පුත් බවක් හා සාවඥ විලාසයක් ද දිස්වේ. රෝම පාලකයෙකු වූ 'ඔගස්ටස්' ගේ ලෝකඩින් කරන ලද ඌර්ධවකායික ප්‍රතිමාව තුළින් ඔහු පිළිබඳ විශිෂ්ට ආකල්පයක් ඇතිකර ගත හැකි ය. 'කරකලා' රජුගේ හා 'හේඩ්රියන්' රජුගේ ඌර්ධවකායික මූර්ති තුළින් ක්ෂණික හැඟීමෙන් යුතු අවිවේකී ස්වභාවය කදිමට නිරූපණය කර ඇත.

රෝම අධිරාජ්‍යයේ පාලකයින් තමාගේ ප්‍රචාරක කටයුතු සඳහා තම තමන්ගේ මුහුණ නිරූපණය කිරීමත්, ප්‍රචලිත කිරීමත් වැදගත් කොට සලකන ලදී. මොවුන් තරම් තමාගේ රුවේ ප්‍රතිනිර්මාණ විසුරුවා හරින ලද පාලක පිරිසක් ලොව තවත් දක්නට නොමැත. මොවුන් විසින් තම අධිරාජ්‍යයේ සෑම නුවරක ම ගමක ම තමාගේ ප්‍රතිමා හා ඌර්ධවකායික රූප විශාල ගණනක් තිබෙන ලෙසට වග බලා ගන්නා ලදී.

රෝම මූර්ති කලාවට නැවත පරමාදර්ශී අංග ඇතුළත් කළ පාලකයෙකු වූයේ 'ඔගස්ටස් සීසර්' ය. ඔහු තමාගේ රුව විවිධාකාරයෙන් ප්‍රතිනිර්මාණය කරවන ලදී. ආගම් ගරුක වූ ප්‍රජාතන්ත්‍රවාදී වූ, දේව වීරයා වූ, චක්‍රවර්ති රජු වූ ආදී ලෙසින් විවිධාකාර ස්වරූපයෙන් යුතු ව ඔහුගේ ප්‍රතිමා නිර්මාණය කරවන ලදී. ආගම් ගරුක වූ ප්‍රජාතන්ත්‍රවාදී වූ, දේව වීරයා වූ , චක්‍රවති  රජු වූ ආදී ලෙසින් විවිධාකාර ස්වරූපයෙන් යුතු ව ඔහුගේ ප්‍රතිමා නිර්මාණය කරවා ඇත. ඔගස්ටස් ආරම්භ කළ මේ ක්‍රමය ඔහුගේ අනුප්‍රාප්තිකයෝ ද අනුගමනය කරන්නට පටන් ගන්නා ලදී. මේ යුගයට අයත් නානක මූලාශ්‍ර වලින් ද මෙය පැහැදිලි වේ. විශේෂයෙන් ම 'නීරෝ හා ගල්බා' ගේ කාසිවල මෙම ලක්ෂණ වඩාත් කැපී පෙනේ.

කෙසේ නමුත් කාලයාගේ ඇවෑමෙන් පරමාදර්ශී සම්ප්‍රදාය ප්‍රතික්ෂේප වී නැවත සත්‍යවාදය ඉදිරියට එන ලදී. මේ බව පැහැදිලි වන ඌර්ධවකායික මූර්තියක් වන්නේ වෙප්සියන් ගේ මූර්තියයි. මෙය විශේෂ අංලකාර වලින් තොර තාත්ත්වික ශෛලියට අනුකූලව නිර්මාණය කරන ලද විශිෂ්ට කෘතියකි.

ක්‍රිස්තු වර්ෂ දෙවන සියවස වන විට රෝම අධිරාජ්‍යය තුළ මූර්ති කලාවේ කිසියම් ආකාරයක පසුබෑමක් දක්නට ලැබේ. මෙයට





ආසන්නම හේතුව ලෙස හඳුනාගත හැකිවන්නේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ කෙරෙහි පාලකයන්ගේ අවධානය යොමු වීම හේතුවෙන් නිර්මාණ ශිල්පියෝ ඒ කෙරෙහි යොමු වීම ය. කෙසේ වෙතත් මේ වන විට රෝම මූර්ති ශිල්පීන් නව නීති හා ක්‍රම අනුගමනය කරන්නට පටන්ගත් බව ලතින් ලේඛනවල සඳහන් වේ. මූර්ති ශිල්පීන් තම අවධානය වඩාත් තදින් යොමු කරන ලද්දේ අධිරාජ්‍යය පාලකයන්ගේ හා ඔවුන්ගේ මිතුරන්ගේ මුහුණුවර නිරූපණය කිරීම කෙරෙහි ය. 'පුද්ගලවාදී තාත්ත්වික සම්ප්‍රදාය මේ යුගයේ දි නැවත වරක් සොයා ගන්නා ලද 'ට්රෙජන්' ගේ ඌර්ධවකායික රූපය මෙයට නිදසුනකි.

ඇස් සිදුරු කිරීමෙන් රෝම ඌර්ධවකායික ලෝකඩ රූපවලට වඩාත් ප්‍රාණවත් භාවයක් ආරෝපණය කිරීමට රෝම කලාකරුවා සමත් විය. සමහර ශිල්පීන් විසින් මූර්තිවල ඇස් සම්පූර්ණ ආකාරයෙන් නිරූපණය කර තිබේ. ඇජරොඩියාස් නුවර කිරි ගරුඬ ප්‍රතිමාවක මේ ලක්ෂණ පැහැදිලිව ම දක්නට ඇත. මේ හැරුණු විට බොහෝ පුද්ගල රූප වල ඇස් සිදුරු ඇති නොකර තිබේ. නමුත් මෙලෙස සිදුරු ඇති නොකිරීමෙන් මූර්තියට හෝ එහි ලක්ෂණ වලට කිසිසේත් හානියක් සිදුවී ඇති බවක් හඳුනා ගැනීමට නැත.

රෝම අධිරාජ්‍යය එහි උච්චතම අවස්ථාවට පත්වන විට රෝම මූර්ති ශිල්පය ක්‍රමයෙන් පිරිහීමේ ලක්ෂණ දක්වන්නට විය. මෙයට හේතු වුණු මූලික කාරණය වන්නේ ගොක්වරුන්ගේ , හන්වරුන්ගේ හා වැන්ඩල්වරුන්ගේ රෝම ආක්‍රමණයන් ය. මෙම ආක්‍රමණිකයන්ගේ මති මතාන්තර හා ඔවුන්ගේ ආගමික සිද්ධාන්ත සමග රෝම වරුන්ගේ සංකල්පය ගැටීම හේතුවෙන් රෝම මූර්ති කලාවේ පමණක් නොව සමස්ත රෝම කලාවේ ම පරිහානිය ඇතිවීමට හේතු වූ බව විචාරකයින්ගේ මතය වේ.